**226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2 ඡේදය | නිවැරදි තොරතුරු ගිණුම් මගින් ඉදිරිපත් කිරීම. | 1.6.2 (ආ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්**,** එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 ප්‍රකාරව, තම වාර්තාකරණ ආයතනයට අදාළ ආදායම් සංකේතය පමණක් ඇතුළත් වන පරිදි 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය සකස්කළ යුතු වුවත්, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වෙනුවෙන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද ආදායම ලෙස රු.44,538,163 ක් ඇතුළත් කර තිබුණි. | අවසන් ගිණුම් කට්ටලයට ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කර ඇති "ඒසීඒ-1" ආකෘතියෙහි අනාවරණය කර තිබූ වෙනත් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කළ ආදායම් රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 ප්‍රකාර භාණ්ඩාගාරයට අවශ්‍ය නොවන බැවින් ඉදිරියට ඒ අනුව කටයුතු කරනු ලබන බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ කෙරෙහි අවධානය යොමුකල යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ආදායම් ලැබීම්**

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව වීසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර හා ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම සම්බන්ධයෙන් වූ ගාස්තු සඳහා මූලික ඇස්තමේන්තුව සඳහා රු.8,480,000,000 ක මුදලක් | 2022 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ආදායම් ඇස්තමේන්තුව ලෙස රු. 8,730,000,000 ක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන ලද අතර මහා භාණ්ඩාගාරය විසින් රු. 8,480,000,000 ක ඇස්තමේන්තුවක් | නිවැරදි ඇස්තමේන්තු වටිනාකම් ගිණුම් වල හෙළිදරව් කිරීමට කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| අනුමත වී තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු. 8,730,000,000 ක් ලෙස සටහන්ව පැවතුණි. | ලබා දී ඇත. මහා භාණ්ඩාගාරය විසින් 2022 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව ලෙස නැවත රු. 23,500,000,000 ක ආදායම් ඉලක්කයක් ලබා දී ඇති අතර එම ප්‍රමාණය ඉක්මවමින් රු. 23,840,584,558 ක ආදායම් රැස් කර ඇතිබව දක්වා තිබුණි. | |

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම් සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු.143,230,188 ක් වුව ද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු ශේෂය143,017,996 ක් වූ බැවින් රු. 212,192 ක වෙනසක් නිරීක්ෂණය විය. 2019, 2020 හා 2021 වර්ෂයන්හි දී ද මෙම වෙනස පිළිබඳ විගණකාධිපති විසින් වාර්තා කළ ද, සමාලෝචිත වර්ෂය තුළදී ද එය නිවැරදි කරගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ පිළියෙල කළ අත්තිකාරම් බී ගිණුමේ සැසඳුම් ප්‍රකාශය තුළ අන්තර්ගතවූ, පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව අතර පැවති රු. 260,983.95 ක වෙනස 2019 වර්ෂයේ රු. 480,793.16 ක් වශයෙන් වැඩි වී තිබුණි. මෙම දෝෂය නිවැරදි කිරීම සඳහා 2021 හා 2022 වර්ෂවල ගත් අඛණ්ඩ ක්‍රියා මාර්ග හේතුවෙන් නිරීක්ෂණයේ සඳහන් වටිනාකම දක්වා වෙනස අඩුවී ඇති අතර, දෝෂය සම්පූර්ණයෙන්ම නිවැරදි කිරීම සඳහා විශේෂ රාජකාරි පැවරීමක් සිදුකර කටයුතු කරගෙන යනු ලබන බව දක්වා තිබුණි. | ශේෂ අතර වෙනසට හේතු සොයා බලා නිවැරදි අගය ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුයි. |

**(ඇ). ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් රැඳවුම් මුදල් ලෙස 2022 දෙසැම්බර් 15 දින ලද රු.2298 ක වටිනාකම සහ 2022 දෙසැම්බර් 30 දින ලද රු. 1,048,121 ක මුළු වටිනාකම වූ රු.1,050,419 ක රැඳවුම් මුදල් තැන්පතු ලෙජරයේ සටහන්කර නොතිබුණු අතර තැන්පතු ලෙජරය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රමාද දෝෂයකින් තැන්පතු ලෙජරයේ සටහන් නොවූ මෙම ශේෂ දෙක නිවැරදිව 2022 වර්ෂයේ කේවල ශේෂ සාරාංශයේ ඇතුළත් කර ඇත. මෙම ශේෂයන්ද සමග වන අවසාන ශේෂය 2022 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර 2023 වර්ෂයේ තැන්පතු ලෙජරයේ නිවැරදිව මෙම ශේෂය ඉදිරියට රැගෙන ගොස් ඇති බව දක්වා තිබුණි. | තැන්පතු ලෙජරය නිසි පරිදි යාවත්කාලීන කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජූලි 20 දිනැති හා අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව ත්‍රෛයිමාසික ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අඛණ්ඩව යොමුකළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්තු ආදායම වාර්තා කිරීමේදී 2022 වසර තුළ ඇතිවූ ප්‍රමාද දෝෂය මගහැර ගනිමින් 2023 වසරේ සිට කාර්තු ආදායම සැසඳුම් කළ වහාම නියමිත දින හෝ එදිනට පෙර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා වගකිවයුතු නිලධාරීන් වෙත උපදෙස් දෙන ලද බව දක්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත දිනට ආදායම් වාර්තා යැවීමට කටයුතු කළ යුතුවේ. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා තැපැල් හා සන්නිවේදන සේවා වැය විෂයය සඳහා (වැය විෂයය අංක 226-1-1-1402) වාර්ෂික ඇස්තමේන්තු තුළ වෙන් කළ රු.50,000,000 ප්‍රතිපාදනවලට අතිරේකව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් යටතේ රු.2,000,000 ක ප්‍රතිපාදන මාරුකර තිබූ නමුත් වර්ෂ අවසානයට රු.782,277.13 ක් එනම් සියයට 39 ක ප්‍රතිශතයක් ඉතිරිවී තිබුණි. | සාමාන්‍ය සේවය යටතේ නිකුත් කරන ගමන් බලපත් තැපැල් කිරීම සඳහා සැලකිය යුතු වියදමක් වාර්ෂිකව දරනු ලබන බැවින් ඉහළ ගිය තැපැල් වියදම සැලකිල්ලට ගෙන 1402 වැය විෂයය සඳහා අතිරේක ප්‍රතිපාදන සලසාගන්නා ලදී. නමුත් හිස් ගමන් බලපත්‍ර හිඟය හේතුවෙන් සාමාන්‍ය සේවා ගමන් බලපත් නිකුත් කිරීම සීමා කිරීම සිදුවූ බැවින් මු.රෙ. 66 යටතේ සලසාගත් අතිරේක ප්‍රතිපාදනයෙන් සියයට 39 ක ප්‍රතිශතයක් ඉතිරිවීමට හේතු වූ බව දක්වා තිබුණි. | උපරිම කාර්යක්ෂමතාවය කින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වේ. |

### 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ (04) ඡේදය ප්‍රකාරව සෑම වියදම් ඒකකයක් විසින්ම දිනපතා තම බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු සිගාස් වෙබ් අඩවියට උත්පනය කළ යුතු වුව ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් එසේ වාර්තාකර නොතිබුණි. | 2022 වර්ෂය අවසානය දක්වාම මාසික අක්මුදල් ඉල්ලුම්පත්‍ර භාණ්ඩාගාරයට යොමුකිරීමක් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු නොකළ බැවින් ඒ හා සමගාමීව අතැති බිල්පත් සඳහා බැදීම ඇති කර ගත් අවස්ථාවේ හා බැරකමක් බවට ලක්වූ අවස්ථාවේ CIGAS මගින් භාණ්ඩාගාරයට වාර්තා කිරීමක් සිදු කර නොතිබුණු බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට වගබලා ගත යුතුයි. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| i | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මු.රෙ.565 (5) | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු 71 ආකෘති පත්‍රයෙහි පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී සෑම මාසයකම පොදු 71 ආකෘතියේ පිළියෙල කරනු ලබන මාසික තැන්පතු සාරාංශය ඊළග මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි පරිදි කටයුතු කල යුතුවේ. |
| | මු.රෙ.563(3) | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තු තැන්පතු ලෙජරය තුළ තුලන ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | නිරීක්ෂණයේ සඳහන් පරිදි එක් එක් මාසයට අදාළ පාලන ගිණුම් තැන්පතු ලෙජරයේ අවසාන පිටු කිහිපය තුල පිළියෙලකර නොතිබුණ බවත් ඉදිරියේදී නිරීක්ෂණයේ සඳහන් පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| | මු.රෙ. 447 (1) | - | දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ පොදු 138 වැය ලෙජරයෙහි පෙර වර්ෂයන් සඳහා ගිණුම්ගත බැඳීම් තීරුවෙහි තොරතුරු ඇතුළත් කර නොතිබුණු අතර ඉතිරිව ඇති නිවැරදි මුදල් ප්‍රමාණය දැනගැනීමට හැකිවන ලෙස බැඳී ඇති බැරකම්ද දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ බැදීම් සහ බැරකම්වලට බැදෙන අවස්ථාවන් වාර්තා නොවීම මත මෙම අඩුපාඩුව සිදුවී ඇති අතර 2023 අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව එවැනි අඩුපාඩු සිදු නොවනු ඇති බව දක්වා තිබුණි. | පොදු 138 වැය ලෙජරයෙහි බැදීම් සහ බැරකම් තොරතුරු නිවැරදිව පවත්වාගෙන යා යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| මු.රෙ. 447 (4) | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව එහි (5) වගන්තියෙහි ප්‍රතිපාදනයන්ට යටත් කොට සියලු බැරකම් ඒවා සිදු වූ විගස වැය ලෙජර් ගිණුමේ වම් පැත්තේ සටහන් කළ යුතු නමුත්, දෙපාර්තමේන්තුවේ බැරකම් සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ බැඳීම් සහ බැරකම්වලට බැදෙන අවස්ථාවන් වාර්තා නොවීම මත මෙම අඩුපාඩුව සිදුවී ඇති අතර 2023 අනුගමනය කරනු ලබන ක්‍රමවේදය අනුව එවැනි අඩුපාඩු සිදු නොවනු ඇති බව දක්වා තිබුණි. | බැරකම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |
| **ii වෙනත් රෙගුලාසි හා මාර්ගෝපදේශවලට අනුකූල නොවීම** | | | | |
| 2010 ජනවාරි 19 දිනැති අංක අමප/09/2101/307/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා 2010 ජනවාරි 04 දිනැති අංක Nscc/2/4/3/2/2/13 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා ලිපිය | - | දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2014 වර්ෂයෙන් පසුව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත 2021 වසරේද ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමැතිය ලබාගැනීමට යොමුකර ඇතත්, මෙතෙක් ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. 2022 වසරේ කමිටුවක් පත්කර කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි. | දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අඩුපාඩුව පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු ජංගම ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට පිළියෙල කල බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් ගෙවීම් රු. 2,136,922 ක් වූ අතර, ඒ තුළ මාස 03 ට වැඩි හඳුනා නොගත් ගෙවීම් රු.350,837 ක් විය. මෙලෙස හඳුනා නොගත් ගෙවීම් ඇතිවීමට හේතු විගණනයට පැහැදිලි නොවිණි. | අදාළ ගෙවීම් හඳුනා ගෙන නිරවුල් කිරිමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි. | අදාළ ගෙවීම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට වගබලා ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ ව්‍යාපෘති 05 කට අදාළව භෞතික ප්‍රගතිය සියයට 0 ත් සියයට 30 ත් අතර පැවති අතර එම ව්‍යාපෘති සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි. | සේවා සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් අනුව වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමද, යෙදවුම් සර්වරය මිලදීගැනීම (Purchasing application server) අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කරනු ලබන බවත්, ඊට අදාළ මූලික කාර්යයන් 2022 අගෝස්තු මාසයේදී ආරම්භ වූ බැවින් මෙය විදේශ රටකින් ගෙන්විය යුතු උපාංගයන් වන බැවින් කාලය ප්‍රමාණවත් නොවීමද, මෘදුකාංග සංවර්ධනට අදාළ ක්‍රියාකාරකම් නැවත සමාලෝචනයේදී ඇතිවූ ගැටළුකාරී තත්ත්වය, අධික කාර්යබහුල රාජකාරී පරිසරය යන හේතු නිසාවෙන් අදාළ කාර්යයන් අවසන් කිරීමට නොහැකි වූ බව සඳහන් කර තිබුණි. | සැලසුම් කල පරිදි කාර්යයන් ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කල යුතු වේ. |

### 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ආපදා ණයශේෂය රු.54,757 ක්, විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ආපදා ණයශේෂ රු.23,228 ක් සහ වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ආපදා ණයශේෂ රු.475,252 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මියගිය නිලධාරියාට මරණ පාරිතෝෂිකයක් නොමැති බැවින් අයකර ගැනීමට ප්‍රමාද වී ඇති බවත්, අකාර්යක්ෂමතාවය නිසා වැඩ තහනම් කල එක් නිලධාරියෙකුගේ රු.72,496 ක ණය ශේෂය විශ්රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරන බවද දන්වා තිබුණි. සේවයෙන් පහකර ඇති අනෙකුත් නිලධාරීන් දෙදෙනාගෙන් අයවිය යුතු රු.107,526 ක් හා රු.179,628 ක ණය මුදල් කඩිනමින් ගෙවන ලෙස ලිපි යවා ඇති බව දන්වා තිබුණි. | ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 ජුනි 27 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2019 හි 03 (අ) ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු වූ නිලධාරීන් 10 ක ගේ ණයශේෂ නිරවුල් කර ගැනීම සඳහා මාස 04 සිට 09 දක්වා කාලයක් ගත වී තිබූ අතර, ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 09 කගේ ණයශේෂ නිරවුල් කර ගැනීම සඳහා මාස 04 සිට 07 දක්වා කාලයක් ගත වී තිබුණි. | පළාත් රාජ්‍ය සේවයේ හා කලාප අධ්‍යාපන කාර්යාලවලට අයත් වූ නිලධාරීන් පිරිසකගේ ණයශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාදයක් සිදුවී ඇති බව පිළිගන්නා බවද ඒ සඳහා විවිධ හේතු බලපා තිබුණ ද, ඉදිරියේදී චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ණය නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව සඳහන්කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ණය ශේෂ නිරවුල් කිරීම කෙරෙහි අවධානය යොමුකල යුතුයි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 256/2017 ප්‍රකාරව වාර්ෂික සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී, මාස්පතා භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳූ බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් සහතිකකර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හඳුන්වා දී තිබූ ආකෘතියට අනුව වාර්ෂික සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති අතර, නිරීක්ෂණයේ සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඉදිරියේදී කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි. | 2017 ජූලි 25 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 256/2017 ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 2016 අගෝස්තු 29 වන දින සිට මේ දක්වා බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ සිට හත්වන මහල දක්වා සහ පියස පරිශ්‍රයේ කොටසක ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කුලී පදනම මත ස්ථාපිත කර ඇති අතර, 2016 සිට මේ දක්වා එකතුව රු.1,947,036,851 ක් ආරක්ෂක අමාත්‍යාංශයට කුලී හා නඩත්තු වියදම් ලෙස ගෙවා ඇති නමුත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි. | 2018.07.25 දින දෙපාර්තමේන්තුවට ඒවා ඇති කෙටුම්පත් ගිවිසුම නීති අංශයට යොමුකර ඇති අතර, ඉන් පසු ඒ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මූල්‍ය අංශය මගින් ගොඩනැගිලි කුලී මුදල් ආරක්ෂක අමාත්‍යාංශය වෙත වැය ශීර්ෂ හරහා ගෙවීම් කර ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ "සුහුරුපාය ගොඩනැගිල්ලෙහි බිම් කුලිය සඳහා මුදල් අයකිරීම" මැයෙන් නිකුත් කරන ලද ලිපි මගින් මාසිකව ගෙවිය යුතු මුදල පිළිබඳව දැනුම් දී ඇති බව දක්වා තිබුණි. | ගිවිසුම්ගත වීම කෙරෙහි අවධානය යොමුකල යුතුවේ. |
| (ඉ) | බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් කුලී ගෙවනු ලබන පළමු මහලේ බැංකු කිහිපයක් (ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව) සඳහා ද දෙවන මහලේ කුරියර් ආයතන දෙකක් සඳහා ද ගනුදෙනු කිරීම සඳහා ඉඩ පහසුකම් | එම ආයතනයන් සඳහා වෙන් කර දී ඇති භූමි ප්‍රමාණය පදනම් කරගෙන ගාස්තු අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව දන්වා තිබුණි. | විධිමත් වූ ක්‍රමවේදයක් යටතේ ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වෙන් කර දී ඇති නමුත් එම ආයතනවලින් කුලී හෝ වෙනත් ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | | |
| (ඊ) | බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ශාඛාවන් ඇතුළත බිම ටයිල් වෙනුවට කාපට් අතුරා ඇති අතර, ඒවාද පළුදු වී ගැලවී ගොස් තිබුණද, ගිවිසුම්ගත වී නොමැතිවීම හේතුවෙන් එම අලුත්වැඩියාවන් සිදුකරන්නේ කෙසේද යන්න පැහැදිලි නොවුණි. | සුහුරුපාය ගොඩනැගිල්ලේ මෙම දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරන ප්‍රදේශයන්හි යොදා ඇති බිම් ඇතුරුම් (Vinyl carpet) කඩිනමින් නවීකරණය කර දෙන ලෙස ඉල්ලා 2022.12.12 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපියක් යොමුකර ඇති බව දක්වා තිබුණි. | නවීකරණ කටයුතු කඩිනමින් සිදුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතු වේ. |
| (උ) | ආයතන සංග්‍රහය XIV පරිච්ඡේදය 4.2 ඡේදය අනුව රාජකාරි කටයුතු සඳහා තමන් වැඩ කරන ස්ථානයෙහිම ගත කරන රාත්‍රී කාලයන් වෙනුවෙන් සංයුක්ත දීමනාව වෙනුවට රාජකාරී දීමනාවක් ගෙවිය යුතු වුව ද, තම රාජකාරී ස්ථානය තුලම රාජකාරී කිරීම වෙනුවෙන් 2022 පළමු කාර්තුව තුළ බලයලත් නිලධාරීන් වෙත රාජකාරී දීමනාවක් ගෙවීම වෙනුවෙන් රු. 5,640,908 ක් සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | බලයලත් නිලධාරීන්ගේ ස්ථිර සේවා ස්ථානය ගුවන්තොටුපල ද ප්‍රධාන කාර්යාලයද යන ගැටළුව කාලයක පටන් සාකච්ඡා වෙමින් පැවතියද, ස්ථිර එකඟතාවක් ලබා නොමැති බව ගොනුව අනුව නිරීක්ෂණය වේ. එබැවින් තවදුරටත් අධ්‍යනය කර ඉදිරියේදී පිළිතුරු ලබාදෙන බව දක්වා තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන කෙරෙහි අවධානය යොමුකල යුතුයි. |
| (ඌ) | පුරවැසි අංශය මගින් හඳුනාගත් අඩුපාඩු විද්‍යුත් තැපැල මගින් අයදුම්කරු දැනුවත් කරනු ලැබුව ද, අදාළ විද්‍යුත් පණිවුඩය යැවූ බවට සාක්ෂි ගොනුව තුළ ඇතුළත් කර නොතිබුණු අවස්ථා පැවති අතර, විදුලි පණිවිඩය යැවුවද, ප්‍රතිචාරයක් නොතිබුණු අවස්ථාවන්හි දී ඒ සම්බන්ධයෙන් පසු විපරම් කර දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් ඉහළ නංවා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | පුරවැසි අංශයේ තොරතුරු පද්ධතියෙන් දැනට විද්‍යුත් තැපැල මඟින් පමණක් අයදුම්කරුවන් දැනුවත් කිරීමේ පහසුකම් ඇති අතර විද්‍යුත් තැපැල සඳහා අයදුම්කරුවන් ප්‍රතිචාර දැක්වීමේ අඩුවක් නිරීක්ෂණය වන බැවින් වර්තමානයේ බොහෝ දෙනා භාවිතා කරන වෙනත් විද්‍යුත් මාර්ගයකින් (WhatsApp මඟින්) අයදුම්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය පහසුකම් ලබාගැනිම පිණිස දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව දක්වා තිබුණි. | ගමන් බලපත් අඩුපාඩු අයදුම්කරුවන් ට නිවැරදි ආකාරයට සන්නිවේදනය වී තිබේද යන්න පිළිබඳව පසු විපරම් කටයුතු සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (එ) | ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මගින් අනුමත කර මුදල් ගෙවීම සඳහා අයදුම්කරුවන් දැනුවත් කළ 2015 වර්ෂයේ සිට 2022 ජුනි 30 දක්වා ලැබූ අයදුම්පත්‍ර 2,160 ක් පැවති අතර එම අයදුම්කරුවන්ට අදාළ සහතිකය නිකුත්කර අනුමත ආදායම එකතු කරගැනීම සඳහා පළමු අවස්ථාවේ දී ස්වයංක්‍රීයව යවන ලද ඊ-මේල් පණිවිඩය හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක්ගෙන නොතිබුණි. | 2021 වර්ෂයේ පරිගණක පද්ධතිය නවීකරණට ලක් කර ඊ-මේල් මඟින් නැවත සිහිකැඳවීමක් සිදුකළ ද මුදල් නොගෙවූ අයදුම්කරුවන් සිටින බැවින් ඉදිරියේදී වෙනත් විද්‍යුත් මාර්ග ඔස්සේ (WhatsApp මඟින්) අයදුම්කරුවන් දැනුවත් කිරිමට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස තොරතුරු තාක්ෂණ අංශය දැනුවත් කර ඇති බව දක්වා තිබුණි. | පවතින අඩුපාඩු මගහරවා ගනිමින් කඩිනම් සේවයක් ලබාදීම කෙරෙහි අවධානය යොමුකල යුතු වේ. |
| (ඒ) | වැලිසර රැඳවුම් කඳවුරෙහි පසුපස තාප්පය උසින් අඩුවීම, ආරක්ෂක භටයින්ට නිරීක්ෂණය නොවීම හා කැමරා පද්ධතිය අක්‍රීයවීම මත රැඳවියන් පැන යාම සිදු වී තිබුණු නමුත්, අදාළ අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී නොතිබුණි. | වැලිසර රැඳවුම් මධ්‍යස්ථානයේ පසුපස කොටසෙහි තාප්පය අමානෝ මීටි යොදා සකස්කර දෙන මෙන් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් පවතින අඩුපාඩු කිහිපයක් සකස්කර ගැනීම සම්බන්ධයෙන් 2022.07.19 දින සහ 2022.08.26 දින වලදී පාලක (පාලන) වෙත ලිපි මඟින් දැනුම් දී තිබෙන අතර ඒ සඳහා වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඇස්තමේන්තුවට අනුව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා වත්තල ප්‍රාදේශීය ලේකම්ට දැනුම් දී ඇති බව දක්වා තිබුණි. | නිවැරදි ආරක්ෂිත විධිවිධාන යෙදිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතුද සිදුකළ යුතු වේ. |
| (ඔ) | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 13 දෙනෙකු එක් වැඩමුරයක් සඳහා සේවයේ යොදවන අතර, කඳවුර වෙත රැඳවියන් ඒමේ දී හා ඉන් පිටව යාමේ දී සටහන් කරගැනීම හැරුණු කොට ආරක්ෂක නිලධාරීන් කඳවුර තුළ සිටින රැඳවියන් ගණනය කොට දිනපතා හෝ කාලීනව තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි. | කඳවුර තුළ සිටින රැඳවියන් ගණනය දිනපතා සිදු කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු බවත්, ඒ සඳහා ඔවුන් එකඟ නොවන බවත්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙහෙයුම් විසින් 2021.05.22 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. නමුත් රැඳවුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල තුළට ඇතුළුවීම නිලධාරීන්ගේ ආරක්ෂාවට තර්ජනයක් බැවින් මෙම දෙපාර්තමේන්තුවට පමණක් දෛනික ගණනය කිරීම සිදුකළ නොහැකි බව දක්වා තිබුණි. | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කඳවුර තුළ සිටින රැඳවියන් ගණනය කොට දිනපතා හෝ කාලීනව තහවුරු කර ගැනීමක් සිදුකළ යුතු වේ. |
| (ඕ) | 2021 මැයි 22 දිනැති අංක සිආදෙ/08/76/2021 දරන ලිපිය අනුව රැඳවියන් මධ්‍යස්ථානයට ඇතුළු කිරීමේ දී ඔවුන්ගේ දේහ පරීක්ෂාව හා ඔවුන් රැගෙන එන බඩු භාණ්ඩ පරීක්ෂා කිරීම, මුදල් හා වටිනා භාණ්ඩ, ජංගම දුරකථන, පරිගණක හෝ වෙනත් සන්නිවේදන උපකරණ, | රැඳවියන් මධ්‍යස්ථානයට ඇතුළු කිරීමේ දී ඔවුන් රැගෙන එන භාණ්ඩ පරීක්ෂා කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එකඟතාවයකට පැමිණ තිබුණ ද, 2021.11.02 දින ඇති වූ නොසන්සුන් තත්ත්වයක් තුල එම භාණ්ඩ නයිජීරියන් ජාතිකයන් විසින් බලහත්කාරයෙන් ඇතුළට රැගෙන යන ලදී. මෙම සිද්ධිය | 2021 මැයි 22 දිනැති අංක සිආදෙ/08/76/2021 දරන ලිපිය අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථානයේ හෝ රැඳවියන්ගේ ආරක්ෂාවට තර්ජනය විය හැකි යම් උපකරණ ඇතිනම් ඒවා රඳවා ගැනීමට සිවිල් ආරක්ෂක නිලධාරීන් එකඟ වුව ද එවැනි භාණ්ඩ රඳවාගැනීමක් සිදුකර නොතිබුණු අතර රැඳවියන් සතුව තිබෙන පෞද්ගලික භාණ්ඩ පිළිබඳව ලැයිස්තුවක් ද මධ්‍යස්ථානය තුළ නඩත්තු කර නොතිබුණි. | සම්බන්ධයෙන් 2021.11.09 දින ආරක්ෂක ලේකම්තුමා වෙත දන්වමින් මේ සඳහා විශේෂ කාර්ය බලකාය ඉල්ලා සිටින ලදී. එතැන් පටන් මෙම තත්වය පාලනය කළ නොහැකි බැවින්, රැඳවියන් විසින් පෞද්ගලික භාණ්ඩ පරිහරණය කරනු ලබන අතර, ගොඩනැගිල්ල තුළට පිවිස භාණ්ඩ ලැයිස්තු ලබාගැනීමට නිලධාරීන්ට අවශ්‍ය නිසි ආරක්ෂාවක් සැපයීය නොහැකි බැවින් එවැනි ලැයිස්තුවක් සකස්කර නඩත්තු කිරීම අපහසු වී ඇති බව දක්වා තිබුණි. | |
| (ක) | 2021 මැයි 22 දිනැති සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අංක සිආදෙ/08/76/2021 ලිපිය අනුව රැඳවියන් විවිධ අවශ්‍යතා සඳහා මධ්‍යස්ථානයෙන් පිටතට රැගෙන යන විටදී හා මධ්‍යස්ථානයෙන් පිටත රඳවා සිටින රැඳවියන්ට ආරක්ෂාව ලබාදීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව එකඟ වුව ද, අදාළ ආරක්ෂාව එම දෙපාර්තමේන්තුවෙන් ලබා නොදෙන බව විගණනයේ දී නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවේ පාලක (පාලන) විසින් 2022.01.25 දින සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙහෙයුම් වෙත මේ සම්බන්ධයෙන් ලිපියක් යොමුකර ඇති අතර එයට පිළිතුරු ලෙස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙහෙයුම් විසින් පාලක ජනරාල් වෙත දැනුම් දී ඇත්තේ නීතිමය ගැටළුවක් මතුවන බැවින් ඔවුන්ට එම රාජකාරී ඉටුකළ නොහැකි බවයි. 2023 සඳහා නව ආරක්ෂක සේවාවක් තෝරා ගැනීමේදී රැඳවියන් පිටත රඳවා සිටින විටදී ආරක්ෂාව සැපයීම අනිවාර්යය කරුණක් ලෙස ඇතුළත් කළ යුතු බව දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | සපයනු ලබන ආරක්ෂක සේවාව යටතේ රැඳවියන් පිටත රඳවා සිටින විටදී ආරක්ෂාව සැපයීම අනිවාර්ය කරුණක් ලෙස සලකා කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 1,292 ක් ද, තත්‍ය කාර්යය මණ්ඩලය 1,040 ක් ද වූ අතර සමාලෝචිත වර්ෂයේ සේවක මණ්ඩල පුරප්පාඩු 275 ක් සහ සේවක අතිරික්ත 23 ක් පැවති අතර මෙහෙයුම් සහකාර සහ විවේකාගාර සහායක යන තනතුරු 02 හි අනුමත තනතුරු සංඛ්‍යාවම පුරප්පාඩු වී පැවතුණි. | 2020, 2021 සහ 2022 වර්ෂයන්හි දී උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිට 2022 වර්ෂයේ දී සංවර්ධන නිලධාරී තනතුරේ පත්වීම් ලද නවක නිලධාරීන් 24 ක් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා ඇතුළත් කර ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇතිබව දක්වා තිබුණි.<br><br>වර්තමානයේ බඳවාගැනීම් නතරකර ඇති | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | බැවින් මෙහෙයුම් සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදුව ඇති බවත් විවේකාගාර සහායක බඳවාගැනීමේ කටයුතු මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 හා 2020.10.26 දිනැති චක්‍රලේඛය පරිදි ක්‍රියා කරමින් තාවකාලිකව අත්හිටුවා ඇති බව දක්වා තිබුණි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුරක් වූ ආගමන හා විගමන පාලක (විමර්ශන හා මෙහෙයුම්) තනතුර වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පැවතුනි. | මෙම තනතුර දෙපාර්තමේන්තුගත විධායක නිලධාරී තනතුරකි. දෙපාර්තමේන්තුගත විධායක II ශ්‍රේණියේ වසර 7 ක සේවා කාලයක් අවශ්‍ය වන මෙම තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු දැනට නොමැති බව දක්වා තිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු වේ. |